අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු (නව නිර්දේශය)

# General Certificate of Education (Adv. Level) Examination, August 2013 (New Syllabus)

## බෞද්ධ ශිෂ්ටාචාරය I / පැය දෙකයි

## Buddhist Civilization I / Two hours

උපදෙස් :

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

01. වෛදික ඉගැන්වීම් මගින් එක් එක් වර්ණයට අයත් ස්වධර්මයන් නියම කොට තිබිණි. එහෙත් ඇතැම් වර්ණයන් තමන්ට නියමිත ස්වධර්ම අභිභවා ගොස් කටයුතු කළ ආකාරයක් දක්නට ලැබේ. (උදාහරණයක් වශයෙන් රජවරුන් සී සෑම, බමුණන් කෘෂිකර්මාන්තයෙහි යෙදීම ආදිය දක්විය හැකි ය.) ඇතැම් ස්වධර්ම බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණත්‍රයට ම සමාන වන නමුදු සමහර ස්වධර්ම අසමාන වේ. ඒ අනුව ඉහත වර්ණ තුනට ම පොදු ස්වධර්මයක් ලෙස සලකා ඇත්තේ,

(1) කෘෂිකර්මාන්තයයි. (2) යාග කරවීමයි. (3) වෙළඳාමයි.
(4) යාග කිරීමයි. (5) කාමයෙහි නොඇලීමයි.

02. ආපදා අවස්ථාවන් හි දී ඒ ඒ වර්ණයන්ට අනුගමනය කළ හැකි ආපද් ධර්ම කොටසක් බ්‍රාහ්මණ ඉගැන්වීමෙහි දක්වා තිබේ. ඒවායින් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණ තුනට ම ආපදා අවස්ථාවන්හි දී සිදු කළ හැකි කටයුත්තක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) යාග කරවීමයි. (2) කෘෂිකර්මාන්තයයි. (3) කාමයෙහි නොඇලීමයි.
(4) ප්‍රජා පාලනයයි. (5) ඉගැන්වීමයි.

03. බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසී යන ආශ්‍රම ධර්ම බ්‍රාහ්මණ සම්ප්‍රදායානුගත ඉගැන්වීමකි. මෙමගින් ජීවිතයේ විවිධ අරමුණු හා පරමාර්ථ සාධනය කර ගැනීමට පුද්ගලයා යොමු කෙරේ. පුද්ගල ජීවිතයේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා යොමු වීම ආශ්‍රම ධර්මවල අවසාන අංග දෙකෙන් අවධාරණය කෙරේ. පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය බුදුසමය අගය කරන නමුදු බ්‍රාහ්මණ සම්ප්‍රදායට අයත් එකී ඉගැන්වීම් විචාරයට හා විවේචනයට ලක් කරයි. ඊට පදනම් ව ඇත්තේ,

(1) ආධ්‍යාත්මික සංවර්ධනය ඇතිකර ගැනීමට පුද්ගලයාට එමගින් ප්‍රමාණවත් කාලයක් නො ලැබීමයි.
(2) ආධ්‍යාත්මික සංවර්ධනය ඕනෑම කාලයක දී කළ නො හැකි වීමයි.
(3) ආධ්‍යාත්මික සංවර්ධනය වයසට පත් වූ පුද්ගලයකු විසින් සිදු කරනු ලැබීම දුෂ්කර වීමයි.
(4) ආධ්‍යාත්මික සංවර්ධනය සමාජයෙන් වියුක්ත ව සිදු කළ නො හැකි වීමයි.
(5) ආධ්‍යාත්මික සංවර්ධනය හුදකලා ව සිදු කළ නො හැකි වීමයි.

04. ජන්මීය සාධකය පදනම් කොට ගෙන බ්‍රාහ්මණ සම්ප්‍රදාය විසින් මානව වර්ගයා උසස් පහත් වශයෙන් බෙදා වෙන් කොට දක්වනු ලැබී ය. බුදුසමය මෙකී වර්ගීකරණය බැහැර කරමින් චතුර් වර්ණය ම සමාන යැයි ද, මානව සංහතියේ ඇත්තේ නානාත්වයක් නොව ඒකත්වයක් බව ද පෙන්වා දෙයි. එසේ නමුත් මානව වර්ගයාගේ යම් විවිධත්වයක් දැකිය හැකි යයි ද අවධාරණය කෙරේ. එකී විවිධත්වයට හේතු වන්නේ,

(1) ජීව විද්‍යාත්මක පදනමයි. (2) ඓතිහාසික පදනමයි. (3) සමාජ විද්‍යාත්මක පදනමයි.
(4) ආචාර විද්‍යාත්මක පදනමයි. (5) ආර්ථික විද්‍යාත්මක පදනමයි.

05. ප්‍රාග් වෛදික හා පශ්චාත් වෛදික යුගවල දී භාරතීය ආගමික ඉතිහාසය තුළ කාන්තාව සම්බන්ධයෙන් විවිධාකාරයෙන් ක්‍රියාකොට තිබේ. අනෙක් යුගවලට සාපේක්ෂ ව පශ්චාත් වෛදික යුගයේ දී කාන්තාව පිළිබඳ අකාරුණික ව කටයුතු කළ ආකාරය ප්‍රකට කෙරෙන සාධකයක් වන්නේ,

(1) මාතෘ දෙවඟන පිදීමයි. (2) පාර්වතී දෙවඟන පිදීමයි. (3) ශක්ති පූජාවයි.
(4) සති පූජාවයි. (5) ජගත්මාතා වන්දනාවයි.

06. වෛදික සමාජය තුළ කාන්තාව සාමාජික වශයෙන් මෙන් ම ආගමික වශයෙන් ද පුරුෂයා හා සමාන වරප්‍රසාද අහිමි වූ තැනැත්තියක වූවා ය. ඇය චපල, අපිරිසිදු, බුද්ධියෙන් හීන, ආධ්‍යාත්මික විමුක්තිය සාධනයෙහි ලා අසමත් තැනැත්තියක ලෙස ද සලකන ලදී. එසේ නමුත් බුදුසමය තුළ කාන්තාව පූර්ණ නිදහසක් භුක්ති වින්ද ය. භික්ෂුණියක, උපාසිකාවක, මවක හා බිරිඳක ලෙස ඇ ලද නිදහස පෙළ දහමින් තහවුරු වේ. උපාසිකාවක ලෙස බුද්ධ කාලීන ව ප්‍රකට එවැනි පරමාදර්ශී කාන්තාවක් වූයේ,

(1) උප්පලවණ්ණා ය. (2) ධම්මදින්නා ය. (3) ඛේමා ය. (4) ඛුජ්ජුත්තරා ය. (5) පටාචාරා ය.

EXAMMOOD.LK

07. ''සත්ත්වයාගේ කෙලෙසීමට හේතුවක් හෝ ප්‍රත්‍යයක් නැත. හේතු ප්‍රත්‍යයක් නොමැති ව ම සත්ත්වයෝ කෙලෙසෙති. එසේ ම සත්ත්වයන්ගේ පිරිසිදුවීමට ද හේතුවක් හෝ ප්‍රත්‍යයක් නොමැත. හේතු ප්‍රත්‍යයක් නොමැතිව ම සත්ත්වයෝ පිරිසිදු වෙති. සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ තමන්ගේ ශක්තියක් බලයක් නොමැති ව ලෝකස්වභාවයට අනුගත ව මුහුකුරා යාමෙන් අභිජාති සයක ම සැප දුක් විඳිති.'' මෙම මතවාදයෙන් ප්‍රකාශ වන්නේ,
(1) නියතිවාදයයි. (2) සංශයවාදයයි. (3) පුබ්බේකතහේතුවාදයයි.
(4) ස්‍යාද්වාදයයි. (5) අමරාවික්ඛේපවාදයයි.

08. ෂට් ශාස්තෘවරුන් අතරින් සමහරු අකිරියවාදී අදහස් පළ කළහ. බුදුරදුන් මෙකී දෘෂ්ටිවාදය දැඩි ව විවේචනයට ලක් කළ අයුරු බෞද්ධ සාහිත්‍යයෙන් හඳුනාගත හැකි ය. ඊට එක් හේතුවක් වී ඇත්තේ,
(1) සමාජය තුළ කිරියවාදීන් බහුල නො වන නිසා ය.
(2) සමාජය තුළ අන්තවාදී ක්‍රියා සිදු නො වන නිසා ය.
(3) සමාජය තුළ සදාචාරය අර්ථවත් කළ නොහැකි නිසා ය.
(4) සමාජය තුළ ආත්මවාදීන් බහුල වන නිසා ය.
(5) සමාජය තුළ ශාස්වතවාදීන් බහුල වන නිසා ය.

09. බුද්ධකාලීන භාරතයේ ශ්‍රමණ සම්ප්‍රදායට අයත් ඇතැම් ශ්‍රමණයෝ ආහාර ගැනීම, විවිධ ඉරියව්, විවිධ ක්‍රියාවන්, විවිධ ඇඳුම් භාවිතය, තිරිසන් සතුන් අනුකරණය කිරීම් ආදිය ආශ්‍රිත ව දුෂ්කර ව්‍රතවල නියැළුණහ. බුදුරජාණන් වහන්සේ මෙකී ව්‍රත සමාදානය විවේචනයට ලක් කළහ. මේ නිසා උන්වහන්සේට ''සියලු තපස්කම් ගරහන්නේ ය, සියලු තවුසන්ට දෙස් නගන්නේ ය, අපහාස කරන්නේය'යි ඇතැම් පිරිස් චෝදනා නැගූහ. බුදුරදුන් එම චෝදනා ප්‍රතික්ෂේප කරමින් පසසා ඇත්තේ,
(1) තමා තවන අනුන් නො තවන ව්‍රත සමාදානයයි. (2) තමා නො තවන අනුන් තවන ව්‍රත සමාදානයයි.
(3) තමා තවන අනුන් ද තවන ව්‍රත සමාදානයයි. (4) අනුන් තවා තමා නො තවන ව්‍රත සමාදානයයි.
(5) තමන් නො තවා අනුනුත් නො තවන ව්‍රත සමාදානයයි.

10. ප්‍රාදේශීය පාලකවරු ස්වාධීනත්වය පළකරමින් වෙන් ව යාම, සොළොස් මහා ජනපද බිහිවීම, වෙන් ව ගිය කුඩා රාජ්‍යවල දේශපාලන ක්‍රම විවිධ ස්වරූපයන් ගැනීම, භාරතීය දේශපාලන ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස සැලකෙයි. ක්‍රි. පූ. අටවැනි සියවසේ දී පමණ සිදු වූ මෙවැනි දේශපාලනික පරිවර්තනයකට ඉවහල් වූ ප්‍රධාන ඓතිහාසික සංසිද්ධියක් ලෙස සැලකෙන්නේ,
(1) පෞරව අධිරාජ්‍යයේ පරිහානියයි.
(2) රාජ්‍යයන් අතර එකමුතුවක් නොමැතිවීමයි.
(3) අධිරාජ්‍යයක් ගොඩනැගීමට පාලකයන් අතර පැවැති අරගලයයි.
(4) බ්‍රාහ්මණ කුලය අභිභවා ක්ෂත්‍රිය කුලය නැගී සිටීමයි.
(5) භාරතයට ජාත්‍යන්තර බලපෑම වැඩිවීමයි.

11. බුද්ධකාලීන භාරතයේ දේශපාලන ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය අතිශයින් සංකීර්ණ ව පැවතුණි. මෙකල ඇතැම් රාජ්‍ය රාජාණ්ඩු වශයෙන් ක්‍රියාත්මක වූ අතර, ඇතැම් ඒවා ගණතන්ත්‍ර ආණ්ඩු වශයෙන් පැවතුණි. මෙසේ පැවැති ගණතන්ත්‍ර රාජ්‍ය අතුරෙන් ප්‍රබල රාජ්‍යයක් ව පැවැතියේ,
(1) මල්ල රාජ්‍යයයි. (2) කෝසල රාජ්‍යයයි. (3) වජ්ජි රාජ්‍යයයි.
(4) කාසි රාජ්‍යයයි. (5) අවන්ති රාජ්‍යයයි.

12. සමාජයේ ප්‍රභවය වූ කලී ඊශ්වර නිර්මාණයක් නො ව විවිධ සාධක මත පදනම් ව, ක්‍රමික ව, හේතුඵලවාදී ව විකාශය වීමේ ප්‍රතිඵලයක් ලෙස බුදුසමය පිළිගනී. ඒ අනුව ප්‍රාථමික සමාජ ඒකකයක් වූ ගෘහස්ථ ජීවිතයේ ප්‍රභවය දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ දී දක්වා ඇත්තේ,
(1) මෛථුන්දම් සේවනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(2) සමාජය තුළ සොරකම් බහුලවීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(3) එක්රැස් කොට අනුභව කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(4) දෘෂ්ටානුගතියට පැමිණීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(5) පෞද්ගලික දේපළ පරිහරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

13. සත්ත්වයා හා ලෝකය මවා පාලනය කරනු ලබන බලවේගයක් ඇතැ'යි ද, එවැනි බලවේග නැතැ'යි ද යනුවෙන් බුද්ධකාලීන ආගමික ඉගැන්වීම් තුළ ප්‍රධාන චින්තන ධාරා දෙකක් පැවතුණි. එවැනි බලවේග පිළිබඳ අස්ත්‍යාර්ථවාදී ව කටයුතු කිරීම,
(1) හේතුඵලවාදය පිළිගැනීමකි. (2) අධිච්චසමුප්පන්නවාදය පිළිගැනීමකි.
(3) පුබ්බේකතහේතුවාදය පිළිගැනීමකි. (4) නියතිවාදය පිළිගැනීමකි.
(5) ඊශ්වර නිර්මාණවාදය පිළිගැනීමකි.

EXAMMOOD.LK
EXAMMOOD.LK

14. 'සක්විති රාජ්‍යය' යනු පියාගෙන් පුතුට උරුම වන දායාදයක් නො වන බව චක්කවත්තිසීහනාද සූත්‍රය අවධාරණය කරයි. බෞද්ධ ඉගැන්වීම් අනුව චක්‍රවර්ති රාජ්‍යය නම් පරමාදර්ශී පාලන තන්ත්‍රයයි. එය බිහිකරගත හැක්කේ,
(1) රටේ ආර්ථික සංවර්ධනය උපරිමත්වයට පත්කර ගැනීමෙනි.
(2) අධාර්මික ක්‍රියා කරන අපරාධකරුවන් මුලිනුපුටා දැමීමෙනි.
(3) ආචාරධර්මය වශයෙන් පාලකයා සුදුසුකම් සපුරා ගැනීමෙනි.
(4) පුරෝහිත බමුණන්ගෙන් අවවාද අනුශාසනා ලබා ගැනීමෙනි.
(5) රාජ්‍ය සේවයේ නියතු වූවන්ට නිසි පරිදි බත් වැටුප් ලබාදීමෙනි.

15. දඬුවම් දීමෙන් පමණක් පුද්ගලයා අපරාධවලින් වළකාගත නොහැකි යැ'යි අවධාරණය කරන බුදුසමය පුද්ගලයා අපරාධවලට පොළඹ වන හේතු සාධක සොයා බලා, ඊට පිළියම් යෙදීමෙන් අපරාධ වළක්වාගත හැකි යැ'යි පෙන්වා දෙයි. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව සමාජගත පුද්ගලයා අපරාධවලට පොළඹ වන එවැනි හේතු අතර එක් ප්‍රධාන හේතුවක් ලෙස පිළිගනු ලබන්නේ,
(1) උගත්කමයි. (2) දිළිඳුකමයි. (3) අධ්‍යාපනයයි.
(4) ධනවත්කමයි. (5) සම්පත් බහුලත්වයයි.

16. නීතිගරුකවීම රටක සෑම පුරවැසියකුගේ ම යුතුකම හා වගකීම වන්නේ ය. සමාජයේ සාමය, සහජීවනය හා යහපැවැත්ම රඳපවතින්නේ නීතිගරුක වීම නිසා ය. නීතිගරුක වීම බුදු දහම ඉතා අගය කොට සලකන අතර, එසේ ඇගයීමට ලක් කළ අවස්ථාවක්,
(1) මහාපදේස තුළින් ප්‍රකට වේ. (2) අපරිහානිය ධර්ම තුළින් ප්‍රකට වේ.
(3) අෂ්ටගරු ධර්ම තුළින් ප්‍රකට වේ. (4) අධිකරණ සමථ ධර්ම තුළින් ප්‍රකට වේ.
(5) දශරාජධර්ම තුළින් ප්‍රකට වේ.

17. ''දානය ද, ප්‍රිය වචන කීම ද, අනුන්ට හිත වැඩ පිණිස හැසිරීම ද, තමන් සේ අනුන් සැලකීම ද යන මේ සතර සංග්‍රහ වස්තු ගමන් කරන්නා වූ රථයකට කඩ ඇණය මෙනි.'' සිඟාලෝවාද සූත්‍රයෙන් අවධාරණය කරන මෙකී යුතුකම් හා වගකීම් අයත් වන්නේ,
(1) මහණ බමුණන්ට ය. (2) කුලපුත්‍රයන්ට ය. (3) ගුරුවරුන්ට ය.
(4) දෙමවුපියන්ට ය. (5) මිත්‍රජනයාට ය.

18. වාචසික සංවරය බුදුසමය බෙහෙවින් අගය කරයි. යහපත් වචන භාවිතය උභයාර්ථය පිණිස ම හේතු වේ. එය නිර්වාණාවබෝධයට අත්‍යවශ්‍ය සාධකයක් ලෙස ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දක්වා ඇත්තේ 'සම්මා වාචා' යනුවෙනි. වාචසික සංවරය චතුර්විධ බව සච්චවිභංග සූත්‍රයේ දක්වා තිබේ. එම චතුර්විධ වාචසික සංවරයේ එක් අංගයක් ලෙස සඳහන් වන්නේ,
(1) අභිජ්ඣාවෙන් වෙන්වීමයි. (2) ව්‍යාපාදයෙන් වෙන්වීමයි. (3) මිථ්‍යා ආජීවයෙන් වෙන්වීමයි.
(4) පරිසයෙන් වෙන්වීමයි. (5) පෙසුඤ්ඤයෙන් වෙන්වීමයි.

19. උපතින් බෞද්ධයකු වූ සෝමදාස ගුණගරුක පුද්ගලයෙකි. සිය යුතුකම් හා වගකීම් නිසි ලෙස තේරුම් ගත් සෝමදාස සිය දිවි දෙවෙනි කොට දෙමාපියන් රැක බලා ගත්තේ ය. සිය ගුරුවරුන්ගේ උපදෙස් හිස මුදුනින් පිළිගත් සෝමදාස ගුරු ගෞරවයට හානි වන කිසිවක් නො කළ කීකරු ශිෂ්‍යයකු විය. නිරන්තරයෙන් භික්ෂූන් වහන්සේගේ අවවාද අනුශාසනා ලද සෝමදාස බෞද්ධ පිළිවෙත් අකුරට ම පිළිපැදි සැබෑ බෞද්ධයකු විය. සෝමදාසගේ යථෝක්ත ක්‍රියාකාරිත්වය අයත් වන්නේ දස පින්කිරියවත්වල එන,
(1) පත්තානුමෝදනයටයි. (2) වෙය්‍යාවච්චයටයි. (3) අපචායනයටයි.
(4) ස්තුතියටයි. (5) දිට්ඨිජු කර්මයටයි.

20. කායික, වාචසික, මානසික ක්‍රියාවන් සිදුකිරීමට පළමු ව එහි විපාකය තමාගේ අයහපත පිණිස හේතුවේ ද, මෙරමාගේ අයහපත පිණිස හේතුවේ ද, තමා හා මෙරමා යන උභය පක්ෂයේ අයහපත පිණිස හේතුවේ දැ'යි නිරන්තරයෙන් ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් පසු තීරණය කළ යුතු යැ'යි බුදුසමය අවධාරණය කරයි. මෙම ස්වාර්ථ පරාර්ථ චර්යාව පිළිබඳ පරමාදර්ශය බෝධිසත්ත්ව ප්‍රතිපදාවයි. බෝසතාණන් වහන්සේ බුද්ධකාරක ධර්මයන් සම්පූර්ණ කරන කාලය තුළ ඇස්, ඉස්, මස්, ලේ පමණක් නොව, සිය ජීවිතය පවා පරිත්‍යාග කළ අවස්ථා ජාතක කථා සාහිත්‍යයෙහි දක්වේ. කුසගින්නේ සිටි ව්‍යාඝ්‍ර ධේනුවකට සිය ජීවිතය දන්දීම ඊට දැක්විය හැකි හොඳ ම නිදසුනයි. බෞද්ධ සාහිත්‍යාගත මෙම තොරතුරුවලට අනුව හොඳ නරක ක්‍රියා තෝරා බේරා ගැනීමේ දී,
(1) ස්වාර්ථයට යම් හානියක් සිදුවුව ද පරාර්ථය ගැන නිරන්තර අවධානයෙන් කටයුතු කළ යුතු ය.
(2) පරාර්ථයට යම් හානියක් සිදුවුව ද ස්වාර්ථය පිණිස කටයුතු කළ යුතු ය.
(3) ස්වාර්ථය හෝ පරාර්ථය ගැන නො සිතා නිදහස් චින්තනයට ඉඩ දී ක්‍රියා කළ යුතු ය.
(4) ස්වාර්ථයට මෙන් ම පරාර්ථයට ද සමාන අවධානයක් යොමු කොට කටයුතු කළ යුතු ය.
(5) ස්වාර්ථය කරා ළඟාවීමට ඕනෑ ම කැපකිරීමක් කළ යුතු ය.

EXAMMOOD.LK

21. චතුරාර්ය සත්‍යය වැනි ගැඹුරු ධර්ම කරුණු ක්ෂීණාශ්‍රවය, ප්‍රත්‍යක්ෂ ඥානයෙන් අවබෝධ කරන අතර, ගෘහස්ථ ප්‍රතිපදාව වඩන උපාසක උපාසිකාවන් ද චතුරාර්ය සත්‍යය ආදී මූලික සිද්ධාන්ත පිළිබඳ අවදිකමකින් කටයුතු කළ යුතු ය. ප්‍රඥාව මෙන් ම ශ්‍රද්ධාව ද විශේෂයෙන් ගිහි ප්‍රතිපදාව වඩන්නකු තුළ අනිවාර්යයෙන් පිහිටිය යුතු පෞරුෂාංගයන් ය. වර්තමාන බොහෝ බෞද්ධයෝ අවිවේකී ගෘහස්ථ ජීවිතය තුළ ප්‍රඥා සංවර්ධනයට ඉවහල් වන භාවනානුයෝගී කටයුතුවලට වඩා දානාදී ආමිස පුද පූජාවන්හි යෙදෙති. භක්තිමත් භාවය වැඩි වූ තරමට භෞතික පුද පූජාවල ද වැඩි වැඩියෙන් යෙදෙති. එහෙත් යථාර්ථාවබෝධය පිණිස තීරණාත්මක සාධකය ප්‍රඥාවයි. බෞද්ධ මූලධර්මවලට අනුව බෞද්ධයකු,

(1) ශ්‍රද්ධාව වැඩිපුර වැඩිය යුතු ය.
(2) ප්‍රඥාව වැඩිපුර වැඩිය යුතු ය.
(3) ශ්‍රද්ධාව වැඩියෙනුත් ප්‍රඥාව අඩුවෙනුත් වැඩිය යුතු ය.
(4) ප්‍රඥාව වැඩියෙනුත් ශ්‍රද්ධාව අඩුවෙනුත් වැඩිය යුතු ය.
(5) ශ්‍රද්ධාව හා ප්‍රඥාව සමබර ව වැඩිය යුතු ය.

22. 'බුදු සමය ගිහියාටත්, පැවිද්දාටත් සිය ජීවිතය අල්පකෘත්‍යතාවෙන් ගත කිරීමට උපදෙස් දෙයි. ගිහියාගේ සහ පැවිද්දාගේ ආධ්‍යාත්මික පරමාර්ථය එකක් වුව ද, විවේකය හා ධාර්මික ප්‍රීති සුවය විඳීමට ඇති මාධ්‍යය හා මාර්ගය එකිනෙකට වෙනස් වෙයි. එහෙත් මෙකී වෙනස බෞද්ධ මූලධර්ම හා විසංවාදී නොවේ. සුත්ත නිපාත පාලියෙහි ''විවිධ ක්‍රීඩා හා රතිය, පංචකාම සුවය වැදගත් සේ නො සිතා, නො පතා විභූෂණයන්හි නො ඇලී, සත්‍යවාදී ව, තනි ව කඟවේනකු සේ කල් ගෙවන්න'' යයි උපදෙස් දෙයි. මෙයින් අවධාරණය කෙරෙන්නේ,

(1) විවේකය ගත කළ යුතු ආකාරයයි.
(2) අල්පකෘත්‍යතාව පිළිබඳ ආකල්පයකි.
(3) සත්‍යවාදී බව පුහුණුකළ යුතු ආකාරයකි.
(4) සෞන්දර්ය රසාස්වාදය විඳගත යුතු ආකාරයකි.
(5) පස්කම් සැපයෙන් වෙන්විය යුතු ක්‍රමෝපායකි.

23. සුළු ව්‍යාපාරිකයකු ලෙස සිය වෘත්තිය ඇරඹූ සිරිදාස නො කළ යුතු වෙළෙඳම් සහ කංසකූට, මානකූට ආදී අයථා උපක්‍රම භාවිත නො කොට, ඉතා ඉක්මණින් දියුණු ව්‍යාපාරිකයකු බවට පත්වූයේ බෞද්ධ ඉගැන්වීම්වල ඇතුළත් ආර්ථික කළමනාකරණය පිළිබඳ ව මනා අවබෝධයකින් යුතු ව උත්සාහය, වීර්යය, අධිෂ්ඨානය, අප්‍රමාදය ආදී යෙදුම්වල භාවිතය ද හොඳින් දන කටයුතු කළ හෙයිනි. ව්‍යාපාරික කටයුතු දියුණුකර ගැනීමට මුල දී බැංකු ණය ගැනීමට සිදු වුව ද ඔහු ඒවා ගෙවීම නිසි පරිදි සම්පූර්ණ කොට බොහෝ සතුටු විය. තමාගේ ව්‍යාපාරික කටයුතු දිනෙන් දින දියුණුවට පත්වනු දක බෙහෙවින් සතුටු වූ සිරිදාස දෙමාපිය, අඹුදරු පෝෂණය ආදී යුතුකම් ඉටුකරමින් ඉමහත් සේ සතුටු විය. තව ද ධාර්මිකත්වය තමාගේ ආධ්‍යාත්මික හා භෞතික දියුණුවේ ප්‍රධානතම හේතුව බව දන හෙතෙම තවදුරටත් සතුටු විය. ඉහත ඡේදයට අනුව සිරිදාස වැඩියෙන් ම සතුටු වූයේ,

(1) අත්ථි සුඛයටයි.
(2) භෝග සුඛයටයි.
(3) අනණ සුඛයටයි.
(4) අනවජ්ජ සුඛයටයි.
(5) සාමිස සුඛයටයි.

24. උත්සාහයෙන්, ශ්‍රම ශක්තිය යොදා දහැමින් ධනය හා සම්පත් සොයා ගනු ලබන පුද්ගලයා විසින් එකී ධන සම්පත් නිසි සේ පරිභෝජනය කළ යුතු ය. එහි ලා බුදුසමය පරිභෝජන දර්ශනයක් ඉදිරිපත් කරයි. ගැඹුරු අවබෝධයකින් යුතු ව කරනු ලබන එම පරිභෝජන දර්ශනය නම්,

(1) නො මුළා ව පරිභෝජනය කිරීමයි.
(2) ධාර්මික ව පරිභෝජනය කිරීමයි.
(3) ආපදාවක දී ගැනීම සඳහා තැන්පත් කොට පරිභෝජනය කිරීමයි.
(4) තමනුත් පරිභෝජනය කොට අනුන්ටත් දී පරිභෝජනය කිරීමයි.
(5) ආයෝජනයට වැඩි කොටසක් යොදා පරිභෝජනය කිරීමයි.

25. පුද්ගලයා විසින් උපයන ලද ධනය කොටස් හතරකට බෙද කළමනාකරණය කොට පරිභෝග කළ යුතු බව සිඟාලෝවාද සූත්‍රයෙහි දක්වා තිබේ. ඒ අනුව පළමු කොටස පරිභෝජනයටත්, දෙකොටසක් ආයෝජනයටත්, සිවුවන කොටස තැන්පත් කොට ආපද අවස්ථාවක දී ප්‍රයෝජනයට ගැනීමටත් යෙදවිය යුතු ය. දෙමාපිය පෝෂණය, සමාජ යුතුකම් ඉටු කිරීම හා මතු සඟ සුව පිණිස හේතුවන, මහණ බමුණන් විෂයෙහි දන්දීමට වැය කළ යුත්තේ සිඟාලෝවාද සූත්‍රයේ දක්වා ඇති පරිදි,

(1) ''එකෙන භොගෙ භුංජෙය්‍ය'' යන කොටසෙනි.
(2) ''ද්වීහි කම්මං පයොජයෙ'' යන දෙකොටසෙනි.
(3) ''චතුත්ථං ච නිධාපෙය්‍ය'' යන කොටසෙනි.
(4) ඉහත කොටස් හතරින් ටික ටික වෙන්කර ගැනීමෙනි.
(5) පළමු කොටස හැර අනෙක් කොටස්වලිනි.

EXAMMOOD.LK

26. බුදුරදුන් වෙත පැමිණි මාරයා උන්වහන්සේට පිරිනිවන් පානා ලෙස ඇරයුම් කළ බව දීඝ නිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වේ. එහි දී උන්වහන්සේ ''භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා යන සිවුවණක් පිරිස විශාරදයන්, බහුශ්‍රැතයන්, ධර්මධරයන් නො වන්නාහු ද, ස්වකීය ආචාර්යවාද ඉගෙන පරවාද කරුණු සහිත ව මැඬලා නෛර්‍යාණික කොට දහම් නො දෙසන්නාහු ද ඒතාක් නො පිරිනිවෙන්නෙමි''යි මාරයා හට අභීතව ම ප්‍රකාශ කළහ. මෙයින් කියැවෙන්නේ,

(1) බුදුරජාණන් වහන්සේගේ මහා සිංහ නාදයයි.
(2) බුදුරජාණන් වහන්සේගේ විශාරද බවයි.
(3) බුදුරජාණන් වහන්සේගේ නිර්භීත බවයි.
(4) බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වයයි.
(5) බුදුරජාණන් වහන්සේගේ යථාවාදී තථාකාරී ගුණයයි.

27. ''සාරිපුත්‍රය මාගේ මේ ශාසනයෙහි සියක් අවුරුදු ආයු ඇති, ඥානයෙන්, සිහියෙන්, ධෘතියෙන්, උතුම් ප්‍රඥාව පිළිබඳ ව්‍යක්තභාවයෙන් යුක්ත වූ ශ්‍රාවකයෝ සතර දෙනෙක් ඇත් ද? ඔවුන් සතර සතිපට්ඨානයන්ගෙන් එකිනෙක ගෙන මා අතින් ප්‍රශ්න විචාරන්නාහු නම් විචාළ විචාළ ප්‍රශ්නය මම ඔවුන්ට විසඳන්නෙමි. මා විසින් විසඳන ලද්ද විසඳූ සේ ඔවුහු දරන්නාහු ය. මත්තෙහි දෙවන ප්‍රශ්නයක් මා නො පිළිවිස්නාහු ය. සැම කල්හි ඔවුහු ප්‍රශ්න විචාරත් ද තථාගත තෙමේ ඒ සියලු ප්‍රශ්න විසඳන්නේ ය. අවුරුදු සියක් ඇවෑමෙන් කාලක්‍රියා කරන්නාහු ය. සාරිපුත්‍රය ඉදින් මා ඇඳක තබා ගෙන පරිහරණය කරන්නාහු නමුදු තථාගතයන් වහන්සේගේ ප්‍රඥාව පිළිබඳ ව්‍යක්තභාවයෙහි වෙනසක් නොමැත.'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදළ අයුරු මජ්ඣිම නිකායේ මහාසීහනාද සූත්‍රයේ දැක්වේ. මෙයින් ප්‍රකට වන්නේ,

(1) බුදුරජාණන් වහන්සේට ප්‍රශ්න විසඳීමට තිබූ හැකියාවයි.
(2) බුදුරජාණන් වහන්සේගේ ව්‍යක්තභාවයයි.
(3) බුදුරජාණන් වහන්සේට සතර සතිපට්ඨානය පිළිබඳ ව තිබූ අවබෝධයයි.
(4) බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාවයි.
(5) බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ශාස්තෘත්වයයි.

28. මහණෙනි මේ මාගේ සිත් හසර නො දන්නා විමංසක මහණ විසින් දෙදහමෙක්හි ලා තථාගතයන් වහන්සේ කෙරෙහි පර්යේෂණ කළ යුතු වෙයි. ඒ කායසමාචාරයෙහි හා වාක්සමාචාරයෙහි ය. කායික වාචසික යම් කෙලෙස් දහමක් තථාගතයන් වහන්සේට වෙද්ද ? නො වෙද්ද ? යනුවෙන් විමංසක මහණ පර්යේෂණ කළ යුතු ය. මජ්ඣිම නිකායාගත මෙකී බුදු වදනින් කියැවෙන්නේ,

(1) පර්යේෂණ ක්‍රමවේදය ගැන බෞද්ධාකල්පයයි.
(2) කායික, වාචසික සමාචාරය පිළිබඳ බෞද්ධාකල්පයයි.
(3) නිදහස් චින්තනය පිළිබඳ බෞද්ධාකල්පයයි.
(4) විමංසක භික්ෂුවගේ ස්වභාවය පිළිබඳ බෞද්ධාකල්පයයි.
(5) තථාගතයන් වහන්සේගේ ස්වභාවය පිළිබඳ බෞද්ධාකල්පයයි.

29. බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩ වසන සමයෙහි දිනක් ඒකපුණ්ඩරීක නම් වච්ඡගොත්ත පරිබ්‍රාජකයාගේ ආරාමයට වැඩි සේක. ''ස්වාමීනි වඩිනු මැනවි, ඔබ වහන්සේගේ පැමිණීම ඉතා අගනේ ය. වැඩ හිඳිනු මැනවි. අසුන් පනවා තිබේ'' යැ'යි බුදුරදුන් සුහදශීලී ව පිළිගෙන තමා ද මිටි අසුනක් ගෙන එකත් පසෙක හුන් බව මජ්ඣිම නිකායේ තේවිජ්ජවච්ඡගොත්ත සූත්‍රයෙහි දැක්වේ. මෙකී සංසිද්ධියෙන් ප්‍රකට වන්නේ,

(1) බුදුරජාණන් වහන්සේ තුළ පැවැති ප්‍රියශීලී බව ය.
(2) බුදුරජාණන් වහන්සේ තුළ පැවැති සරල බව ය.
(3) බුදුරජාණන් වහන්සේ තුළ පැවැති ආගමික සහනශීලී බව ය.
(4) බුදුරජාණන් වහන්සේ තුළ පැවැති සමාජශීලී බව ය.
(5) වච්ඡගොත්ත පරිබ්‍රාජකයා බුදුරදුන්ගේ සමීපතම දායකයකු වූ බවයි.

30. ''මහණ ගොයම්හු වූ කලී තමන් වෙත පැමිණෙන්නවුන් එන්න, මෙහි ආයේ මැනවැ'යි කියා පිළිගන්නා සුළු ය. කනට සුව එළවන තෙපුල් බණන්නෝ ය. පිළිසඳරෙහි දක්ෂ ය. බැමි නො හකුළුවන්නේ ය. සුලබ කථා ඇත්තේ ය. පැමිණියවුනට තුමූ පළමුවෙන් කථා කරන සුලු ය. මහණ ගොයම්හු වූ කලී භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා යන සිවු පිරිස විසින් සත්කාර කරන ලදහ. ගරු කරන ලදහ. බුහුමන් කරන ලදහ. පුදන ලදහ. මහණ ගොයුම් කෙරෙහි බොහෝ දෙවියෝත්, මිනිසුනුත් මෙසේ සිත් පහන් ය.'' යනුවෙන් සෝණදණ්ඩ බමුණු තෙම තවත් බමුණු පිරිසකට ප්‍රකාශ කළ බව දීඝ නිකායේ සෝණදණ්ඩ සූත්‍රයේ දැක්වේ. මෙම සමස්ත ප්‍රකාශයෙන් ප්‍රකට වන්නේ,

(1) බුදුරදුන් තමා වෙත එන්නවුන් සුහදශීලී ව පිළිගත් බව ය.
(2) බුදුරදුන් සිවුවනක් පිරිස විසින් පුදන ලද බව ය.
(3) බුදුරදුන් ප්‍රශස්ත ශාස්තෘවරයකු වූ බව ය.
(4) බුදුරදුන් දෙව් මිනිසුන්ගේ සිත් පහන් කළ ශාස්තෘවරයකු වූ බව ය.
(5) බුදුරදුන් තත්කාලීන ව අන්‍යයන්ගේ ඇගයීමට ලක් වූ බව ය.

EXAMMOOD.LK

31. තත්කාලීන භාරතීය ශ්‍රමණ සම්ප්‍රදායන්ගේ ආභාසය ලබමින් සුවිශේෂී පරමාර්ථ හා ප්‍රතිපත්ති සහිත සංවිධානයක් ලෙස බෞද්ධ පැවිදි සංවිධානය ගොඩනැගුණි. බෞද්ධ පැවිද්දෙහි විකාශය, පැවිදි කිරීමෙහි ක්‍රමවේදය හා පැවිද්ද සම්බන්ධ සීමා නියමයන් හඳුන්වාදීම යන උභය අංශයෙන් ම සිදු වූ බව පෙනේ. කාලීන ව පැන නැගුණු ගැටලු නිරාකරණය කිරීම් වස් පැවිද්ද සම්බන්ධ සීමා නියමයන් පනවා තිබේ. මහාවග්ගපාලියට අනුව භික්ෂූන් උදෙසා ආචාර්ය-උපාධ්‍යාය තනතුරු පත්කොට ඇත්තේ එවැනි අවශ්‍යතාවක් පදනම් කොට ගෙන ය. එකී අවශ්‍යතා වූයේ,

(1) භික්ෂුව, භික්ෂු ආකල්පවලින් බැහැර ව කටයුතු කිරීම වැළැක්වීමයි.
(2) මහජන ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමයි.
(3) විෂමාචාර පුද්ගලයන් සසුන්ගත වීම වැළැක්වීමයි.
(4) භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමයි.
(5) සසුන ආරම්භ වී දිගු කලක් ගත වී පිරිහී තිබීමයි.

32. බුදුරදුන් භික්ෂූන්ට වස්සාන ඍතුවෙහි වස් එළඹීමට නියම කළහ. ඒ අනුව දුටු මිතුරු වූ, දැඩි මිතුරු වූ බොහෝ භික්ෂූන් කොසොල් දනව්වෙහි එක්තරා ආරාමයක වස් විසූහ. ඔවුන් අපි කවර ක්‍රමයකින් සමඟි ව, සතුටුවෙමින්, විවාද නො කර ගනිමින්, පහසුවෙන් වස් එළඹෙමු දැ'යි සිතා ඔවුනොවුන් හා කථා නොකර සිටීමට ගිවිස ගත්හ. වස් විසූ තෙමස තුළ ම ඒ ආකාරයෙන් කල් ගෙවූ මේ භික්ෂූහු වස් අවසානයේ බුදුරදුන් හමුවීමට ගියහ. එහි දී බුදුරදුන් වස් තෙමස තුළ ඔවුන් අනුගමනය කළ ප්‍රතිපත්තිය විවේචනයට හා ගර්හාවට ලක් කොට පවාරණය කරන්නට අනුදැන වදාළහ. මෙහි දී සිදුකළ යුතු කාර්යභාරයක් ද නියම කළහ. එකී ශාසනික කාර්යභාරය වන්නේ,

(1) එක් භික්ෂුවක් තවත් භික්ෂුවකට අනුශාසනා කිරීම ය.
(2) සංඝයාට තමන් පිළිබඳ ව ඇති ඇවැත් ප්‍රකාශ කරන්නට අවකාශ දී ඇවැත්වලට පිළියම් යෙදීමට ප්‍රතිඥා දීම ය.
(3) තමා පිළිබඳ ව විවේචනය කරන්නට අනෙක් භික්ෂූන්ට අවකාශ සලසා දීම ය.
(4) වස් අවසානයේ දී භික්ෂූන් ඒකරාශී වී ධර්මය පිළිබඳ සාකච්ඡා කිරීම ය.
(5) සියලු භික්ෂූන් ඒකරාශී වී ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීම ය.

33. බුද්ධ කාලීන භික්ෂු භික්ෂුණී සමාජ සංස්ථාවන්හි පරමාදර්ශී වූ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත රැසක් පිළිබඳ ව තොරතුරු බෞද්ධ මූලාශ්‍රයවල දැක්වේ. උදහරණ වශයෙන් කජංගලා තෙරණිය දැක්විය හැකි ය. කජංගලා වැසි උවසුවෝ කජංගලා තෙරණිය වෙත ගොස් දහම පිළිබඳ තමන්ට තිබූ සැක මුසු තැන් විසඳ ගත්හ. අනතුරු ව තෙරණිය තවදුරටත් ඒවා පැහැදිලි කර ගැනීම සඳහා බුදුරදුන් වෙතට යන ලෙස එම උපාසකවරුන්ට උපදෙස් දුන්නා ය. බුදුරදුන් වෙත ගිය උපාසකවරුන්ට තමන් වහන්සේ පවා ප්‍රශ්න විසඳන්නේ කජංගලා තෙරණිය විසඳූ ආකාරයට ම යැ'යි පවසමින් එය එසේ දරන ලෙසට වදළහ. මෙම සමස්ත ප්‍රවෘත්තියෙන් ප්‍රකට වන්නේ,

(1) කජංගලා උවසුවෝ කජංගලා තෙරණියගෙන් දහම් ඇසීමට පුරුදු ව සිටි බව ය.
(2) කජංගලා තෙරණියට පැන විසඳීමෙහි ලා බුදුරදුන් හා සමාන හැකියාවක් තිබූ බව ය.
(3) කජංගලා තෙරණිය බුදුරදුන්ගේ ඇගයීමට ලක් වූ බව ය.
(4) කජංගලා තෙරණිය ධර්ම ප්‍රචාරයෙහි සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළ බව ය.
(5) කජංගලා තෙරණිය ධර්ම දේශනා කිරීමෙහි ව්‍යක්ත වූ බව ය.

34. බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ඇවෑමෙන් ශාසන භාරධාරී මහතෙරවරුන්ගේ මූලිකත්වයෙන් සිදු කරන ලද ප්‍රථම ධර්ම සංගීතියේ දී තීන්දු තීරණ රැසකට එළඹි බව දක්නට ලැබේ. ඒවා ථෙරවාදි බුදුසමයේ සුරක්ෂිතතාව පිණිස ඉවහල් විය. මෙකී තීන්දු තීරණ පශ්චාත් කාලීන සංගීති සඳහා ද මූලාශ්‍රයක් වූ බව ඇතැම් විචාරකයන්ගේ මතයයි. එහෙත් ථෙරවාදී බුදුසමයේ චිරස්ථිතිය සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් මෙහි දී සිදුවිය. එය නම්,

(1) කථාවත්ථුප්පකරණය රචනා කිරීම ය.
(2) සංඝයා සඳහා පැන වූ නීති උල්ලංඝනය නො කිරීමටත්, නො පැන වූ නීති නො පැනවීමටත් තීරණය කිරීම ය.
(3) ආනන්ද තෙරණුන්ට චෝදනා කිරීම ය.
(4) සුභද්‍රගේ අභද්‍ර වචනය ප්‍රතික්ෂේප කිරීම ය.
(5) දුසිල් මහණුන් සසුනෙන් නෙරපීම ය.

35. බෞද්ධ දර්ශනය, සංස්කෘතිය පමණක් නොව, භාෂා සාහිත්‍යාදී විවිධ විෂය ක්ෂෙත්‍ර පිළිබඳ අධ්‍යයනය, අධ්‍යාපනය හා පර්යේෂණය සඳහා ප්‍රකට වූ කීර්තිමත් විශ්වවිද්‍යාල ගණනාවක් භාරතයේ පැවැතිණි. මෙම විශ්විද්‍යාලවලින් බොහොමයක් මහායාන බෞද්ධ ඉගැන්වීම්වලට මූලිකත්වය දුන් මහායාන විශ්වවිද්‍යාල ලෙස ප්‍රකට ව පැවැති අතර එක් පැරණි බෞද්ධ විශ්වවිද්‍යාලයක් මහායාන නො වන බෞද්ධ නිකායවලට අයත් ආයතනයක් ලෙස පැවතුණි. එම අධ්‍යාපන ආයතනය වූයේ,

(1) නාලන්ද විශ්වවිද්‍යාලය ය. (2) වලභි විශ්වවිද්‍යාලය ය. (3) ජගද්දලා විශ්වවිද්‍යාලය ය.
(4) වික්‍රමශිලා විශ්වවිද්‍යාලය ය. (5) ඕදන්තපුරි විශ්වවිද්‍යාලය ය.

EXAMMOOD.LK

36. ථෙරවාදය මෙන් ම වෙනත් බෞද්ධ සම්ප්‍රදායන්ගේ පැවැත්ම, අභිවෘද්ධිය හා ව්‍යාප්තිය වෙනුවෙන් භාරතීය බෞද්ධ පාලකයන්ගෙන් සිදු වූ මෙහෙය අතිවිශාල ය. භාරතීය ශාසන ඉතිහාසයේ කුෂාණ යුගය මෙහි ලා සන්ධිස්ථානයක් වශයෙන් සැලකිය හැකි ය. කණිෂ්ක රජතුමා බුදුසමය වැළඳ ගැනීමෙන් අනතුරු ව බුදුසමයේ සංරක්ෂණය, සංවර්ධනය හා ව්‍යාප්තිය වෙනුවෙන් මහත් මෙහෙවරක් ඉටුකළ පාලකයකු වශයෙන් සම්භාවනා ලබයි. බුදුසමයේ උන්නතිය වෙනුවෙන් මෙතුමා කළ ප්‍රමුඛ කාර්යක් වන්නේ,

(1) දුසිල් මහණුන් සසුනෙන් නෙරපා ශාසනය පිරිසිදු කිරීම ය.
(2) ථෙරවාදී බුදුසමය දේශාන්තරයන්හි ව්‍යාප්ත කිරීම ය.
(3) ථෙරවාදී ධර්ම සංගීතියක් පැවැත්වීමට අනුග්‍රහ කිරීම ය.
(4) විසිරී පැවැති ථෙරවාදී ධර්මය ඒකරාශී කිරීම ය.
(5) ධර්මය තඹ තහඩුවල ලියා තැන්පත් කිරීම ය.

37. ප්‍රාග් බෞද්ධ යුගයේ දී ශ්‍රී ලංකාවේ විවිධ ඇදහිලි හා විශ්වාස මෙන් ම, භාරතයේ ප්‍රකට ව පැවැති ආගමික සංවිධානවල ක්‍රියාකාරිත්වයන් ද පැවැති බව ඓතිහාසික මූලාශ්‍රය පෙන්වා දෙයි. මේ අතර ජෛනාගම මෙරට ව්‍යාප්ත ව පැවැති බවට, සාක්ෂියක් ලෙසින් ඇතැම් ජෛන සාධුවරුන් උදෙසා පණ්ඩුකාභය රජු ආරාම ඉදිකරදීම පෙන්වා දිය හැකි ය. එවැනි එක් ජෛනාගමික සාධුවරයෙක් වූයේ,

(1) ව්‍යාධදේවයා ය. (2) ජුතින්ධර ය. (3) කුම්භණ්ඩ ය.
(4) මහෙජ ය. (5) වෛශ්‍රවණ ය.

38. අතීතයේ දී "බ්‍රහ්ම දේශය" යනුවෙන් හඳුන්වා තිබූ බෞද්ධ රාජ්‍යය වන්නේ වර්තමාන,

(1) තායිලන්තයයි. (2) චීනයයි. (3) මියන්මාරයයි.
(4) කොරියාවයි. (5) ජපානයයි.

39. තායි භික්ෂු ශාසනය "ධම්මයුත්තික නිකාය" හා "මහා නිකාය" යනුවෙන් වෙන් කොට විනය නීති දැඩි ලෙස පවත්වාගෙන යාමට අනුබල දෙන ලද්දේ,

(1) සූර්යවංශික රාම රජතුමා විසිනි. (2) අනවරථ රජතුමා විසිනි. (3) ධම්මචේතිය රජතුමා විසිනි.
(4) මොන්කුත් රජතුමා විසිනි. (5) ක්‍යෝංසිත්ථ රජතුමා විසිනි.

40. මිහිඳු මාහිමියන් ප්‍රමුඛ දූත කණ්ඩායමක් විසින් ලක්දිවට බුදුසමය හඳුන්වා දෙනු ලැබූහ. මෙහි දී මිහිඳු මාහිමියන් ධර්ම දේශනා රාශියක් සිදුකරන ලද බවත්, එයින් මෙරට විශාල ජන සංඛ්‍යාවක් බුදුසමය වැළඳගත් බවත් ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් වේ. මෙම දේශනාවන්ට පාදක කරගත් සූත්‍ර රැසක් පිළිබඳ තොරතුරු දක්නට ලැබේ. ඒ අනුව මිහිඳු මාහිමියන් මෙරටට පැමිණ මුල්දින කිහිපය තුළ දී දේශනා කරන ලද සූත්‍ර ලෙස සඳහන් වන්නේ,

(1) චූල්ලහත්ථිපදෙපම, ආසිවිසෝපම, මහාසමය යන සූත්‍ර ය.
(2) චූල්ලහත්ථිපදෙපම, අනමතග්ගිය, දේවදූත යන සූත්‍ර ය.
(3) චූල්ලහත්ථිපදෙපම, දේවදූත, කූටදන්ත යන සූත්‍ර ය.
(4) චූල්ලහත්ථිපදෙපම, අනමතග්ගිය, මහා සුදස්සන යන සූත්‍ර ය.
(5) චූල්ලහත්ථිපදෙපම, අග්ගික්ඛන්ධොපම, සාමගාම යන සූත්‍ර ය.

41. මිහිඳු මාහිමියන්ගේ අනුශාසකත්වයෙන් මෙරට ථෙරවාදී බුදු සසුන ස්ථාපිත වූ අතර, ඒ සඳහා දෙවන පෑ තිස් නිරිඳු පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබා දුන්හ. ථෙරවාදී බුදු සසුනේ ලක්දිව කේන්ද්‍රස්ථානය වශයෙන් මහා විහාරය ගොඩනැගූ දෙවන පෑ තිස් රජතුමා වෙස්සගිරිය, ඉසුරුමුණිය, ථූපාරාමය ආදී වූ වෙහෙර විහාර රාශියක් ද ඉදි කෙළේ ය. මීට සමගාමී ව සඟමිත් තෙරණියගේ මූලිකත්වයෙන් මෙරට පිහිටි වූ භික්ෂුණී ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් ද රජතුමා මහඟු මෙහෙවරක් ඉටු කෙළේ ය. ඒ අනුව භික්ෂුණීන් සඳහා මෙරට ඉදිකළ ප්‍රථම ආරාමය ලෙස වාර්තාගත වන්නේ,

(1) වෙස්සගිරිය ආරාමයයි. (2) පාචීනාරාමයයි. (3) ඉසුරුමුණියයි.
(4) හත්ථාල්හක ආරාමයයි. (5) ථූපාරාමයයි.

42. භාරතය තුළ බෞද්ධ ග්‍රන්ථ විනාශ වෙද්දී එම ග්‍රන්ථ එක්රැස් කොට ඒවා සිය දේශයේ භාෂාවට නගා සංරක්ෂණය කිරීම පිණිස විශාලතම දායකත්වය සපයන ලද බෞද්ධ රට වන්නේ,

(1) බුරුමයයි. (2) තායිලන්තයයි. (3) ජපානයයි. (4) කොරියාවයි. (5) චීනයයි.

43. ජපන් සෙන් (Zen) නිකායේ ප්‍රමුඛ ඉගැන්වීම "සසෙන්"(Sazen) යනුවෙන් හඳුන්වනු ලබන භාවනාව ය. සසෙන් (Sazen) යනු ධ්‍යාන මුද්‍රාවෙන් හිඳගෙන කරනු ලබන ශූන්‍යතා භාවනාවයි. එසේ භාවනා කිරීමෙන් ක්‍රමික ව හෝ ක්ෂණික ව බුද්ධත්වය ලැබිය හැකි බව සෙන් (Zen) ඉගැන්වීමයි. මෙම බුද්ධත්වය හැඳින්වීම සඳහා භාවිත කරනු ලබන්නේ,

(1) බොන් යන්න ය. (2) මත්සුරි යන්න ය. (3) බුත්සු යන්න ය.
(4) සතොරි යන්න ය. (5) ජෝදෙ යන්න ය.

EXAMMOOD.LK

44. බුදුසමයේ ආභාසයෙන් මෙරට ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති ශිල්පය, චිත්‍ර කලාව වැනි සෞන්දර්යාත්මක කලා විෂයන් මෙන් ම සිංහල භාෂා සාහිත්‍යය ද පෝෂණය විය. ඇතැම් ගත්කතුවරු බුදුරදුන්ගේ නව අරහාදි බුදු ගුණයන්ගෙන් **එකක්** තෝරාගෙන රසවත් කතාන්තරයක් මාර්ගයෙන් බුදු ගුණ වැනීමට උත්සාහවත් වූහ. පොළොන්නරු යුගයේ විසූ ගුරුළුගෝමීන්ගේ අමාවතුර නම් සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථය බිහිවෙන්නේ මෙහි ප්‍රතිඵලයක් වශයෙනි. මෙකී ග්‍රන්ථයෙන් විස්තර වෙන්නේ බුදුරදුන්ගේ,

(1) අරහං ගුණයයි. (2) සුගතෝ ගුණයයි. (3) පුරිසදම්මසාරථී ගුණයයි.
(4) සත්ථා දේවමනුස්සානං ගුණයයි. (5) භගවා ගුණයයි.

45. මථුරා බුදු පිළිමයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ ලෙස දැක්විය හැක්කේ,

(1) ශාක්‍යසිංහ ලීලාව, විවෘත නෙත්, ස්වාභාවික හිස කෙස් ය.
(2) ශාක්‍යසිංහ ලීලාව, විවෘත නෙත්, කැරලි ගැසුණු හිස කෙස් ය.
(3) ශාක්‍යසිංහ ලීලාව, අඩවන් නෙත්, ස්වාභාවික හිස කෙස් ය.
(4) ශාක්‍යසිංහ ලීලාව, අඩවන් නෙත්, කැරලි ගැසුණු හිස කෙස් ය.
(5) ශාක්‍යසිංහ ලීලාව, මන්දස්මිතය, ස්වාභාවික හිස කෙස් ය.

46. බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පියා පූජාර්හ වස්තු සඳහා ගොඩනැගිලි විශේෂයන් නිර්මාණය කළ බව දක්නට ලැබේ. ඒ අනුව ''භාරතයේ දී චෛත්‍ය ශාලා'' නමින් ප්‍රකට ගෘහ නිර්මාණය වෙනුවට ''ථූපඝරය'' හෝ ''චේතියඝරයත්'' බෝධීන් වහන්සේ සඳහා ''බෝධිඝරයත්'' ඉදිකරන ලදි. මුල් කාලයේ දී බුදු පිළිමය බෝධීන් වහන්සේගේ සෙවණේ හෝ ස්තූපය වටා පිහිට වූ අතර, පසු කාලීන ව ඒ සඳහා ද ''පටිමාඝර'' නමින් සුවිශේෂී ගෘහයක් නිර්මාණය කොට ඇත. මීට අමතර ව උපෝසථඝර, පධානඝර යනාදී නම්වලින් හැඳින්වෙන බෞද්ධාගමික ගොඩනැගිලි විශේෂයන් ද ඉදි වූ බව දක්නට ලැබේ. මේවායින් ''ගෙඩිගේ'' නමින් හැඳින්වෙන බෞද්ධ ගොඩනැගිලි විශේෂය,

(1) බෝධිඝරයකි. (2) පධානඝරයකි. (3) පටිමාඝරයකි.
(4) උපෝසථඝරයකි. (5) චේතියඝරයකි.

47. අතීත ශ්‍රී ලාංකික බෞද්ධ රජවරුන්ගේ ප්‍රධාන අනුශාසකත්වය දැරූ හිමිවරුන් කිහිපදෙනෙකුගේ නම් මූලාශ්‍රයවලින් සොයාගත හැකි ය. දේවානම්පිය තිස්ස රජුගෙන් ආරම්භ වන ශ්‍රී ලාංකික බෞද්ධ රාජ වංශයේ රජවරු ගණනාවක් මෙසේ බෞද්ධ භික්ෂූන් ප්‍රධාන අනුශාසකත්වයේ තබාගෙන කටයුතු කොට ඇත. ඒ අනුව සද්ධාතිස්ස රජුගේ අනුශාසකත්වය දරන ලද්දේ,

(1) කුපික්කල තිස්ස හිමියන් ය. (2) මහාසුම්ම හිමියන් ය. (3) කාල බුද්ධරක්ඛිත හිමියන් ය.
(4) සංඝමිත්‍ර හිමියන් ය. (5) කොහොන් තිස්ස හිමියන් ය.

48. මහනුවර යුගයට අයත් දෙගල්දොරු විහාරයේ චිත්‍ර ද සමකාලීන ව දහ අටවන සියවසේ අඳින ලද වෙනත් විහාරවල දක්නට ලැබෙන චිත්‍ර ද සම්ප්‍රදාය හා ශෛලිය අතින් පොළොන්නරුවේ චිත්‍රවලට බෙහෙවින් වෙනස් වේ. එවැනි එක් වෙනසක් ලෙස දැකිය හැකි වන්නේ,

(1) බුද්ධි ගෝචර බවයි. (2) තාත්ත්වික බවයි. (3) අක්ෂි ගෝචර බවයි.
(4) පර්යාලෝකය දක්වා තිබීමයි. (5) අවකාශය බහුල ව යොද තිබීමයි.

49. ඈත අතීතයේ පමණක් නොව, වර්තමානයේ පවා ලාංකික ජන සමාජයේ කලා රසාස්වාදය පිණිස සිදු කරනු ලබන බොහෝ නිර්මාණයන්ගේ දැකිය හැක්කේ බෞද්ධාභාසයයි. බෞද්ධ තේමා මුල් කරගත් ගීත, නාට්‍ය පමණක් නොව, චිත්‍රපටවලට ද වර්තමාන සමාජයේ ඉතා ඉහළ ප්‍රතිචාර ලැබේ. මෙයට හොඳ ම උදාහරණය මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ නිර්මාණයන් ය. සරච්චන්ද්‍රයන් මනමේ නාට්‍යය නිර්මාණය කෙළේ බෞද්ධ ජාතක කථාවක් පදනම් කරගෙන ය. ඒට වස්තු විෂය වූ ජාතක කථාව වූයේ,

(1) සේරිවාණිජ ජාතකයයි. (2) උම්මග්ග ජාතකයයි. (3) ලෝමහංස ජාතකයයි.
(4) කුස ජාතකයයි. (5) චුල්ලධනුද්ධර ජාතකයයි.

50. දිව්‍යාවදානය, මූල සර්වාස්තිවාදී විනය, ක්ෂුද්‍රකවස්තුව, ක්‍රියා සංග්‍රහය, විෂ්ණු ධර්මෝත්තර පුරාණය යනාදී මූලාශ්‍රයයන්හි ස්තූපාංග රැසක් පිළිබඳ තොරතුරු දක්නට ලැබේ. භාරතීය සම්භවයක් සහිත බෞද්ධ ස්තූපයට විවිධාංග ඒකරාශී වූයේ එහි විකාශයත් සමඟ ය. ක්‍රි. පූ. තුන්වන සියවසේ සිට හත්වන සියවස දක්වාත්, ඉන් පසුවත් ශ්‍රී ලංකාවේ ස්තූපයට ද විවිධ ස්තූපාංග හා ස්තූප උපාංග එකතුවීමෙන් සංවර්ධනයට පත් ව තිබේ. මෙසේ විකාශයට පත් ස්තූපයේ අණ්ඩය මත නිර්මාණය කරන ලද වේදිය හඳුන්වා ඇත්තේ,

(1) කුච්ඡිවේදී යනුවෙනි. (2) පාදවේදී යනුවෙනි. (3) හත්පීවේදී යනුවෙනි.
(4) මුද්ධවේදී යනුවෙනි. (5) අධෝවේදී යනුවෙනි.

*****

EXAMMOOD.LK

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු (නව නිර්දේශය)

**General Certificate of Education (Adv. Level) Examination, August 2013 (New Syllabus)**

බෞද්ධ ශිෂ්ටාචාරය II / පැය තුනයි

**Buddhist Civilization II / Three hours**

උපදෙස්:

- I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **දෙකක් පමණක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.)

01. (i) බුදුරජාණන් වහන්සේගේ ත්‍රිවිද්‍යා ඥාන කෙටියෙන් හඳුන්වන්න.
(ii) බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය ප්‍රකට කළ අවස්ථා **දෙකක්** ගෙන හැර දක්වන්න.
(iii) සිය ශ්‍රාවක-ශ්‍රාවිකාවන්ගේ දක්ෂතා හඳුනා ගැනීම සහ වගකීම් පැවරීම සම්බන්ධයෙන් බුදුරදුන් ප්‍රකට කළ නිපුණතාව උදාහරණ **දෙකක්** මඟින් පැහැදිලි කරන්න.
(iv) බුදු සිරිතේ සුවිශේෂී ලක්ෂණයක් ලෙස "යථාවාදී-තථාකාරී, යථාකාරී-තථාවාදී" ගුණය උදාහරණ මඟින් පැහැදිලි කරන්න.
(v) බුදුරදුන්ගේ පද්මකාර ජීවන දර්ශනය නූතන සමාජයට අදාළ කර ගැනීමේ වැදගත්කම සාරාංශ කොට ඉදිරිපත් කරන්න.

02. (i) ධනෝපාර්ජනය හා ශ්‍රමය අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධය බෞද්ධ ඉගැන්වීම් අනුව සංක්ෂේපයෙන් ගෙනහැර දක්වන්න.
(ii) "සමජීවිකතාව" යනු කුමක් ද'යි මූලාශ්‍රය මඟින් හඳුන්වා දෙන්න.
(iii) සුරාපානයේ ආදීනව පිළිබඳ සූත්‍රගත තොරතුරු ගෙනහැර දක්වන්න.
(iv) ස්වාමි-භාර්යා යුතුකම් හා වගකීම් සිඟාලෝවාද සූත්‍රානුසාරයෙන් පෙන්වා දෙන්න.
(v) පරිසර හිතකාමීත්වය බුදුසමයේ ඇගයුමට ලක් වී ඇති අයුරු ප්‍රකට කරන්න.

03. (i) බුදුරදුන් ජීවමාන කාලයේ දී බුදු සසුන ව්‍යාප්ත ව පැවැති ප්‍රදේශ පිළිබඳ හැඳින්වීමක් කරන්න.
(ii) ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට ඉවහල් වූ හේතු සම්පිණ්ඩනය කොට දක්වන්න.
(iii) ධර්ම විනයෙහි සංරක්ෂණය පිණිස ප්‍රථම ධර්ම සංගීතියේ දී ගනු ලැබූ පියවර කවරේ ද'යි පෙන්වා දෙන්න.
(iv) පැරණි භාරතීය විශ්වවිද්‍යාල අතුරෙන් වලභී විශ්වවිද්‍යාලයට හිමිවන සුවිශේෂත්වය ප්‍රකට කරන්න.
(v) අශෝක ධර්මය සඳහා බුදු දහමේ ආභාසය ලැබී ඇති බවට සාධක **හතරක්** ඉදිරිපත් කරන්න.

## II කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **තුනක් පමණක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.)

04. (i) ඊශ්වර නිර්මාණවාදය යනු කුමක් ද'යි පැහැදිලි කොට, චතුර් වර්ණයේ දිව්‍යමය ප්‍රභවය පිළිබඳ බ්‍රාහ්මණ මතය ගෙනහැර දක්වන්න.
(ii) "ජන්මීය සාධක අනුව මානව වර්ගයා උසස් පහත් ලෙස වර්ග කළ නො හැකි ය." බෞද්ධ මූලාශ්‍රය මඟින් තහවුරු කරන්න.
(iii) ස්ත්‍රීත්වය පිළිබඳ බ්‍රාහ්මණ සමාජයෙහි පැවැති ආකල්පය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
(iv) බුදු සමය තුළ මාතෘත්වයට හිමි වී ඇති ගෞරවණීය තත්ත්වය සහේතුක ව පෙන්වා දෙන්න.

05. (i) පූරණ කස්සපගේ අකිරියවාදය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.
(ii) අකිරියවාදී ආගමික අදහස් බෞද්ධ ඉගැන්වීම්වලින් ප්‍රතික්ෂේප වන ආකාරය පරීක්ෂා කරන්න.
(iii) හොඳ නරක ක්‍රියා විනිශ්චයේ දී චේතනාව හා විපාකය පිළිබඳ ව බුදුසමය සැලකිලිමත් වී ඇති ආකාරය පැහැදිලි කරන්න.
(iv) යථාර්ථය පිළිබඳ අවදිකම පුද්ගලයාගේ පෞරුෂ සංවර්ධනය පිණිස ඉවහල් කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

EXAMMOOD.LK
EXAMMOOD.LK

06. (i) දැහැමි සමාජයක් බිහිකර ගැනීම පිණිස බෞද්ධ දේශපාලන මූලධර්ම උපයෝගී කොටගත හැකි අයුරු සැකෙවින් ගෙනහැර දක්වන්න.
(ii) පොදු සම්පත් කළමනාකරණය පිළිබඳ ආරාමික නීති රීති හා සිරිත් විරිත් වත්මන් සමාජයට උපයෝගී කර ගැනීමේ වැදගත්කම ප්‍රකට කරන්න.
(iii) බුද්ධ ශ්‍රාවක ශ්‍රමණයන් සෙසු භාරතීය ශ්‍රමණයන්ගෙන් ගුණාත්මක වශයෙන් වෙනස් වන ආකාරය පරීක්ෂා කරන්න.
(iv) වස් පවාරණය භික්ෂුවගේ ආයති සංවරය පිණිස ඉවහල් වන අයුරු පෙන්වා දෙන්න.

07. (i) අතීතයෙහි පැවැති බුරුම ශ්‍රී ලංකා බෞද්ධ සබඳතා දෙරටේ ම බෞද්ධ සංස්කෘතියේ පෝෂණයට ඉවහල් වූ ආකාරය පැහැදිලි කරන්න.
(ii) ජපානයේ බෞද්ධ උත්සව ජපන් ජන ජීවිතය තුළ බෞද්ධාගමික ප්‍රබෝධය ඇති කිරීම පිණිස පාදක වී ඇති ආකාරය පරීක්ෂා කරන්න.
(iii) ශ්‍රී ලාංකික සමාජධර්ම බුදුසමයේ ආභාසයෙන් සැකැසුණු අයුරු පෙන්වා දෙන්න.
(iv) පැරණි ශ්‍රී ලංකාවේ රජයත්, බුදු දහමත් අතර පැවැති අන්‍යෝන්‍ය සම්බන්ධය ඓතිහාසික නයින් පරීක්ෂා කරන්න.

08. (i) ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ සදාචාරධර්ම ජනනය කිරීමේ මාධ්‍යයක් ලෙස විහාර සිතුවම් කලාව උපයෝගී කොටගත් අයුරු පෙන්වා දෙන්න.
(ii) ශ්‍රී ලාංකික බුද්ධ ප්‍රතිමාවන් හි ප්‍රකට ව දැකිය හැකි මුද්‍රා ලක්ෂණ සනිදර්ශන ව පෙන්වා දෙන්න.
(iii) සාංචි ස්තූපයට සාපේක්ෂ ව ශ්‍රී ලාංකික ස්තූපවල දක්නට ලැබෙන සුවිශේෂතා කවරේ දැ'යි පෙන්වා දෙන්න.
(iv) ජන විඥානය තුළට බෞද්ධ ඉගැන්වීම් සන්නිවේදනය කිරීමෙහි ලා ලාංකික බෞද්ධ ගීත සාහිත්‍යයෙන් ලැබුණු දායකත්වය ප්‍රමාණ කරන්න.

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK